# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1704/14 - 2011 මැයි 5 වැනි බ්‍රහස්පතින්දා - 2011.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/20/32/2007.

**කාර්මික ආරවුල් පනත-131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2008.09.03 දිනැති හා අංක 1565/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2008.08.27 වැනි දින දරන නියෝගයෙන් එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 301හි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කඳාන, කොළඹ පාර, අංක 57හි පිහිටි ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමුකරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2011.03.14 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 මාර්තු මස 29 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය,
අංක 301, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

*නඩු අංකය :* ඒ 3251 *පැමිණිලිකාර වෘත්තිය සමිතිය......*

සහ

ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් (ප්‍රයි) ලිමිටඩ්,
අංක 57, කොළඹ පාර,
කඳාන.

.................*වගඋත්තරකාර සමාගම*

ප්‍රදානය

1. 1957 අංක 14 සහ 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අන පනත් වල 131 වැනි අධිකාරිය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු සම්බන්ධතා හා මිනිස් බල ගරු අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න මහතාගේ අංක අයිආර්/20/32/2007 හා 2008.08.27 දිනත් දරන ලිපිය මගින්, මෙහි පහත නම් සඳහන් මා ඉහත කී පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම හා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

2. කම්කරු කොමසාරිස්ගේ අංක අයිආර්/20/32/2007 හා 2008.08.24 දිනත් දරන ලිපියේ ඉහත කී පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වශයෙන් ද ස්වදේශීය ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් ලිමිටඩ් විසින් 2007.07.21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී ලිපියට අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් සේවක සේවිකාවන්

52නාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත ද යන්න හා යුක්ති සහගත නොවේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න වශයෙන් දක්වා ඇත. එකී උපලේඛනය මෙම ප්‍රධානයෙහි කොටසක් ලෙසට X වශයෙන් ලකුණු කර මෙයට යා කර ඇත.

03. ඉහත කී යොමු කිරීම අනුව කාර්මික අධිකරණය වෙත ඉහත නම් සඳහන් පැමිණිලිකාර වෘත්තීය සමිතිය පළමුවන හා දෙවන ප්‍රකාශ ගොනු කළ අතර, වගඋත්තරකාර සමාගම පළමු ප්‍රකාශය පමණක් ගොනු කර ඇත.

04. ඒ අනුව මෙම නඩුව 2009.02.11 වැනි දින විභාගයට ගත් අවස්ථාවේ දී බේරුම්කරනය විසින් නඩුව විභාගයට ගැනීමට පෙර මෙම ආරවුල සම්බන්ධයෙන් සමථයක් තිබේ දැයි දෙපාර්ශවය විමසා බැලූ අතර, එවැනි සමථයක් මේ දක්වා ඇති කර ගැනීමට නොහැකි වූ බව දෙපාර්ශවයේම නීතිඥ මහතුන් ප්‍රකාශ කරන ලදින් මෙම බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇති පළමුවන ප්‍රකාශය මගින් වගඋත්තරකාර සමාගම විසින් X වශයෙන් ලකුණු කර අති උපලේඛනයේ සඳහන් සේවකයින් 52කගේ සේවය අවසන් කිරීම පිළිගෙන ඇති බැවින්, නඩුව ආරම්භ කිරීමට වගඋත්තරකාර පක්ෂයේ නීතිඥ මහතාට බේරුම්කරණය විසින් දැනුම් දුන් අවස්ථාවේ දී වගඋත්තරකාර සමාගම වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නීතිඥ ගෝවින්ද දයාසිරි මහතා සාමාන්‍ය සේවය අවසාන කිරීමක් සිදු වන්නේ විනයානුකූල පියවරක් වශයෙන් නොවන අවස්ථාවක දී ඔප්පු කිරීමේ භාරය සේවා යෝජක පාර්ශවයට පැවරීම පිළිගත හැකි න්‍යායක් නමුත් සාක්ෂි ආඥාපනතේ සාමාන්‍ය නීති භාවිතාවේත් විශේෂ හේතුවක් සේවක පාර්ශවයේ ඇති බවට, සඳහන් කර සේවා අවසන් කිරීමක් වී ඇති නම් එය කම්කරු නීතියේ අනියම් සේවක උවදුරක් හෝ කඩා කප්පල්කාරී ක්‍රියාවක් සේ සේවකයින් පළිගැනීමේ චේතානාවෙන් කරන බවට තමන් ඉදිරිපත් කරන ලද, ලේඛණ වල සඳහන් වන අවස්ථාවක දී එකී කරුණු ඉදිරිපත් කරන පුද්ගලයින් විසින් එවැනි අවස්ථාවකදී එය ඔප්පු කිරීමේ කාර්යය එකී පාර්ශවයට පැවරෙන බවත්, මක් නිසාද, ඉදිරිපත් කරන ලද ලේඛන වල එම කරුණු දීර්ඝව පළමුවන ප්‍රකාශයෙන් සඳහන් කර ඇති අතර, දෙවන ප්‍රකාශයේ ඒ පිළිබඳව කරුණු ගැබ් කර 04 වැනි ඡේදයේ සඳහන් කර ඇති බවත් දක්වන ලදී.

05. මේ අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා විසින් මෙම නඩුව ආරම්භ කල යුත්තේ පැමිණිලිකාර වෘත්තිය සමිතිය විසින් බවට ඉදිරිපත් කල කරුණු සම්බන්ධයෙන් මෙම නඩුවේ වගඋත්තරකාර සමාගම විසින් ගොනු කර තිබෙන ප්‍රකාශයේ ඉතාමත් පැහැදිලි ලෙස මෙම සේවකයින්ගේ සේවය අවසාන කිරීම පිළිගෙන ඇති බවත්, එලෙස සේවකයින්ගේ සේවය අවසන් කිරීම පිළිගන්නා අවස්ථාවෙකදී සමාගම විසින් නඩුව ආරම්භ කළ යුතු බවත්, ඉල්ලුම්කාර සංගමයේ නීතිඥ මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

06. දෙපාර්ශවයේ නීතිඥ මහතුන්ගේ ඉහත කී සැලකිරීම් වලින් පසුව මෙම නඩුව ආරම්භ කළ යුත්තේ කුමන පාර්ශවය විසින් ද යන්න පිළිබඳව තීරණයක් ලබාදීම සඳහා ඉහත කී කරුණු සම්බන්ධයෙන් ලිඛිත කරුණු ඉදිරිපත් කරන ලෙසට බේරුම්කරණය විසින් දෙපාර්ශවයට නියෝග කරන ලදී. අනතුරුව ඉහත කී දෙපාර්ශවය විසින් තම ලිඛිත දේශණ බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, බේරුම්කරණය විසින් නිකුත් කරන ලද 2009.05.28 දිනත් දරන නියෝගය මගින්. වගඋත්තරකාර සමාගමේ ස්ථාවරය ප්‍රතික්ෂේප කරමින් මෙම නඩුව වගඋත්තරකාර සමාගම විසින් ආරම්භ කළ යුතු බවට තීරණය කරන ලදී.

07. ඉහත කී තීරණයෙන් පසු මෙම නඩුව, යලිත් 2009.06.22 වැනි දින බේරුම්කරණය හමුවේ විභාගය සඳහා දිනයක් නියම කිරීමට කැඳවූ අවස්ථාවේ දී මෙම නඩුවේ සමථයක් ඇති කර ගැනීමට හැකිනම් ඒ බව බේරුම්කරණය වෙත මීළග දින බේරුම්කරණය වෙත දැනුම් දෙන ලෙසට දෙපාර්ශවය වෙත දැනුම් දෙන ලදී. මේ අනුව, මෙම නඩුව 2009.08.07, 2009.10.02, 2009.11.06, 2009.12.09 යන දින වල කැඳවූ අතර, එකී දිනයන්හි මෙම නඩුව සමථ කිරීම සඳහා සාකච්ඡා කරන ලදී.

08. මෙම නඩුව 2010.08.18 වැනි දින කැඳවූ අවස්ථාවේ දී වගඋත්තරකාර සමාගම විසින් බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත. 2010.05.13 දිනැති වන්දි ගෙවීමේ උපලේඛනයෙහි සඳහන් සේවකයින් 52කට එකී උපලේඛනය මගින් ගෙවීමට යෝජිත වන්දි මුදල් ගෙවා මෙම ආරවුල පූර්ණ හා අවසාන සමාදානයක් වශයෙන් සමථයකට පත් කර ගැනීමට එකඟ බව ප්‍රකාශ කළ අතර ඉල්ලුම්කාර සමාගම ද එකී එකඟතාවයට කැමැත්ත පල කරන බව බේරුම්කරණය ඉදිරියේ දෙපාර්ශවය ප්‍රකාශ කරන සිටින ලදී. එසේම මෙම නඩු වාර්තාවේ කොටසක් ලෙසට X වශයෙන් සලකුණු කොට ඇති ඉහත කී උපලේඛනයේ සඳහන් මුදල් වාරික 2කින් ගෙවීමට කැමැත්ත පළ කරන බවද, එකී වාර්තා දෙක මාස දෙකකින් එක් මසකට එක් වාරිකයක් බැගින් ගෙවීමට වගඋත්තරකාර සමාගම එකඟතාවය පළ කර ඇත. ඉල්ලුම්කාර සංගමය ද, එකී එකඟතාවය සඳහා තම කැමැත්ත පළ කරන ලදී. ඒ අනුව එකී වාරික මෙම බේරුම්කරණ නඩුවේ ඉහත කී X දරන උපලේඛනයේ සඳහන් එක් එක් සේවකයාගේ නමින් නිකුත් කරනු ලබන චෙක්පත් මගින් ගෙවීමට සහ ලබා ගැනීමට ඉහත කී දෙපාර්ශවය එකඟත්වය පළ කරන ලදී. ඒ අනුව එහි පළමු වාරිකය චෙක්පත් මගින් 2010.09.30 වැනි දින ප. ව. 2.30ට රැගෙන ඒමට වගඋත්තකාර සමාගම එකඟත්වය පළ කරන ලද අතර ඉල්ලුම්කාර

සංගමය ද ඊට එකඟත්වය පළ කරන ලද අතර චෙක්පත් මගින් මුල් වාරිකය ගෙවීම 2010.09.30 වැනි දිනට ගෙවීම බේරුම්කරන අධිකරණය විසින් නියෝග කරන ලදී.

09. අනතුරුව මෙම නඩුව වර්ෂ 2010.10.27 වැනි දින කැඳවූ අවස්ථාවේ දී මෙම නඩුවේ මුල් වාරික ගෙවීම 2010.09.30 බේරුම්කරණ අධිකරණය නොවැලැක්විය හැකි රාජකාරී කටයුත්තක් නිසා එදින මෙම නඩුව කැඳවා නොමැති බැවින් මෙම නඩුව බේරුම්කරණ අධිකරණයේ නියෝග පරිදි 2010.10.27 වනි දින කැඳවන ලද අතර ඉහත සමථය අනුව වාරික 2න් ගෙවීමට නියමිතව තිබූ වන්දි මුදලට අදාල වාරික 2 සඳහා චෙක්පත් 2ක් මගින් එකී 2010.10.27 වැනි දින අදාල සේවක මහතුන්ට ගෙවීමෙන් මෙම ආරවුල සමථයකට පත් කර ගැනීමට හැකි බව වගඋත්තරකාර සමාගම ප්‍රකාශ කරන ලදින් පැමිණිලිකාර සංගමයට ඊට කැමැත්ත පළ කරන ලදී. එසේම එකී 2010.10.27 වැනි දින චෙක්පත් ලබා ගැනීම සඳහා පැමිණ නොමැති සේවක මහතුන් මීලග දින එකී චෙක්පත් භාර ගැනීම සඳහා පැමිණෙන ලෙසට ලියාපදිංචි තැපැල මගින් දැනුම් දෙන ලෙසට පැමිණිලිකාර සංගමයට බේරුම්කරණය විසින් නියෝග කරන ලදින් ඒ අනුව එදින බේරුම්කරු හමුවට පැමිණ සිට ඒ ඒ සේවක මහතුන්ට වගඋත්තකාර සමාගම විසින් බේරුම්කරණය ඉදිරියේ අදාළ චෙක්පත් අත්සන් ලබාගෙන භාරදුන් අතර එකී මුදල් ලබාගත් බවට ලදුපත් ච ලබාගෙන එයින් පිටපතක් බේම්රුකරණය වෙත ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී. මේ අනුව මෙම සමථය පූර්ණ හා අවසාන නියෝගය වශයෙන් පිළිගෙන නඩු පොතට අත්සන් කරන ලදී.

10. මෙම නියෝගය අනුව ඉහත සඳහන් X දරන වන්දි ගෙවීමේ උපලේඛනය නඩු ගොනුවේ 77 වැනි පිටුවේ දක්වා ඇති අතර මුදල් ලබාගත් බවට අදාල ලදුපත් නඩු ගොනුවේ 86 සිට 183 දක්වා වූ පිටුවල සඳහන්ව ඇත. එකී ලේඛණ මෙම ප්‍රධානයේ කොටසක් ලෙසට සලකමි. තවද, ඉහත කී X දරන උපලේඛනයේ අංක 46 නම් සඳහන් සේවා අංක 440 එම්. එච්. ඉලංගකෝන් බණ්ඩාර හේරත් යන අය සහ අංක 8 නම සඳහන් සේවා අංක 306, එච්. ඒ. ක්‍රිස්ටි සිල්වා යන අයගේ චෙක්පත් මෙම නඩුව ඉතිරි සේවකයින්ගේ වන්දි මුදල් ගෙවීම සඳහා 2010.11.12 වැනි දින කැඳවූ අවස්ථාවේ දී ලබා දුන් අතර ඉහත කී X දරන උපලේඛනයේ අංක 28 යටතේ දක්වා ඇති සේවා අංක 388 ඩී. එම්. පී. එල්. එස්. එල්. කුමාර යන අයට හිමි රු. 105,000 සඳහා වූ වන්දි මුදල් ඇතුළත් මහජන බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 353415 හා 2010.10.21 දිනැති චෙක්පත් හා අංක 207069 සහ 2010.09.21 දිනැති චෙක්පත් එම සේවක මහතා සොයා ගැනීමට නොහැකි බැවින් භාරදීමට නොහැකි බවත් අනිකුත් සේවක ඉහත කී X දරන උපලේඛනයේ අංක 23 යටතේ නම් සඳහන් සේවා අංක 355 කේ. එස්. සිල්වා යන අය දැනට විදේශ ගත වී ඇති බැවින් ඔහු වෙනුවෙන් විධිමත් බලය පැවරීමක් ඇති තැනැත්තෙක් මේ දක්වා ඉදිරිපත් වී නොමැති බැවින් එම වන්දි මුදලට ගෙවීමේ හැකියාවක් වගඋත්තරකාර සමාගමට නොමැති බව බේරුම්කරණය හමුවේ ප්‍රකාශ කල අතර ඒ අනුව ඉහත කී කේ. එස්. සිල්වා යන අයට හිමි වූ රු. 147,250 වූ වන්දි මුදල ඇතුළත් 207064 සහ 2010.09.21 දිනැති චෙක්පත හා 353410 සහ 2010.10.21 දිනැති චෙක්පත් අනන්‍යතාවය ඔප්පු කිරීමෙන් පසු ඉහත කී සේවකයාට ලබා ගත හැකි වන පරිදි ජා-ඇල සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කිරීමට නියෝගයක් ලබා දෙන ලෙස වගඋත්තරකාර සමාගමෙන් ඉල්ලා සිටින ලදින් එකී ඉල්ලීම අනුව ඉහත විස්තර කරන සේවකයින් 2කගේ චෙක්පත් 4 ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසුව අදාල සේවකයින්ට නිකුත් කිරීම සඳහා ජා-ඇල සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කිරීමට බේරුම්කරණය විසින් නියෝග කළ අතර ඉහත කී චෙක්පත් නිකුත් කර ඇත්තේ එම සේවකයින්ගේ නමින් බැවින් එම චෙක්පත් 4 වෙනුවට එක් එක් සේවකයාට හිමි වූ මුළු වන්දි මුදල සඳහා එක් චෙක්පත් බැගින් ජා-ඇල සහකාර කම්කරු කොමසාරිස්ගේ නමට චෙක්පත් නිකුත් කර මෙම නියෝගයේ දින සිට මසක් ඇතුළත එකී ජා-ඇල කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසට වගඋත්තරකාර සමාගමට බේරුම්කරණය විසින් නියෝග කරන ලද අතර එසේ තැන්පත් කිරීමෙන් පසුව වගඋත්තරකාර සමාගම කාර්මික අධිකරණයේ ලේකාධිවරයා වෙත දැනුම් දිය යුතු බවටත්, එකී දැන්වීම් ලිපියේ පිටපතක් පැමිණිලිකාර සංගමය වෙත යවන ලෙසටත් වැඩිදුරටත් නියෝග කරන ලදී.

11. මේ අනුව කී X දරන උපලේඛනයේ නම් සඳහන් සේවකයින් 52ට දෙපාර්ශවය විසින් එකඟ වූ වන්දි මුදල ලබා දීමෙන් හා ලබා ගැනීමෙන් මෙම ආරවුල පූර්ණ හා අවසාන වශයෙන් සමථයකට පත් වූ බවට නියෝග කරමි.

12. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රධානයක් බවට මම සළකමි.

13. මෙම සමථය අදාළ සේවකයින්ට හිමි අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් වලට අගතියක් නොවන බවට සටහන් කරමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2011ක් වූ මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

## THE SWADESHI INDUSTRIAL WORKS LIMITED

### Compensation Payable as at 31st July, 2007 For Union Members

| *Serial No.* | *Name* | *Emp No.* | *Dept.* | *Date Joined* | | | *No. of Yerars Completed* | *Date of Birth* | | | *Date of Retirement* | | | *Lost of Carrier (Years)* | *Basic Salary 20-Jul-2007* | *Budget Allowance* | *Total Salary* | *Compensation 75% from Salary Year of Service* | *One Week Salary for lost of Service* | *Total Compensation (Rs.)* | *1st Installment* | *2nd Installment* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | *Year* | *Month* | *Date* | | *Year* | *Month* | *Date* | *Year* | *Month* | *Date* | | | | | | | | | |
| 1. | T. Sunil Peris | 20 | Eng | 1988 | 7 | 1 | 19 | 1959 | 5 | 13 | 2014 | 5 | 13 | 7 | 10,100.00 | 550.00 | 10,650.00 | 151,762.50 | 18,637.50 | 170,400.00 | 85,200.00 | 85,200.00 |
| 2. | K. M. T. Kamalawarna | 32 | Soap Fini | 1983 | 1 | 14 | 24 | 1966 | 9 | 14 | 2021 | 9 | 14 | 14 | 8,750.00 | 550.00 | 9,300.00 | 167,400.00 | 32,550.00 | 199,950.00 | 99,975.00 | 99,975.00 |
| 3. | K. J. Anthony Perera | 34 | Soap Fini | 1985 | 1 | 1 | 22 | 1958 | 10 | 28 | 2013 | 10 | 28 | 6 | 8,750.00 | 550.00 | 9,300.00 | 153,450.00 | 13,950.00 | 167,400.00 | 83,700.00 | 83,700.00 |
| 4. | K. D. G. Rohitha | 65 | Printing | 1981 | 2 | 25 | 26 | 1959 | 4 | 14 | 2014 | 4 | 14 | 7 | 8,675.00 | 600.00 | 9,275.00 | 180,862.50 | 16,231.25 | 197,093.75 | 98,546.88 | 98,546.88 |
| 5. | S. Sumithra | 86 | Soap Fini | 1980 | 7 | 8 | 27 | 1958 | 11 | 23 | 2008 | 11 | 23 | 1 | 7,875.00 | 600.00 | 8,475.00 | 171,618.75 | 2,188.75 | 173,737.50 | 86,868.75 | 86,868.75 |
| 6. | D. L. M. C. Alwis | 102 | Soap Fini | 1988 | 10 | 1 | 18 | 1964 | 11 | 23 | 2019 | 11 | 23 | 12 | 7,875.00 | 600.00 | 8,475.00 | 114,412.50 | 25,425.00 | 139,837.50 | 69,918.75 | 69,918.75 |
| 7. | W. A.D. Mark Arnold | 301 | Soap Fini | 1989 | 3 | 1 | 18 | 1962 | 4 | 25 | 2017 | 4 | 25 | 10 | 8750.00 | 550.00 | 9,300.00 | 125,550.00 | 23,250.00 | 148,800.00 | 74,400.00 | 74,400.00 |
| 8. | H. A. Christy Silva | 306 | Soap Fini | 1989 | 3 | 1 | 18 | 1953 | 4 | 27 | 2008 | 4 | 27 | 1 | 8750.00 | 550.00 | 9,300.00 | 125,550.00 | 2,325.00 | 127,875.00 | 63,937.50 | 63,937.50 |
| 9. | D. D. Wickramaratne | 308 | Soap Fini | 1989 | 5 | 1 | 18 | 1970 | 12 | 2 | 2025 | 12 | 2 | 18 | 8750.00 | 550.00 | 9,300.00 | 125,550.00 | 41,850.00 | 167,400.00 | 83,700.00 | 83,700.00 |
| 10. | W. R. D. Weerasingha | 309 | W. P. | 1989 | 5 | 1 | 18 | 1958 | 10 | 9 | 2013 | 10 | 9 | 6 | 7,875.00 | 600.00 | 8,475.00 | 114,412.50 | 12,712.50 | 127,125.00 | 63,562.50 | 63,562.50 |
| 11. | H. D. T. Anthony Perera | 314 | Soap Fini | 1989 | 11 | 1 | 17 | 1958 | 12 | 16 | 2013 | 12 | 16 | 6 | 8,750.00 | 550.00 | 9,300.00 | 118,575.00 | 13,950.00 | 132,525.00 | 66,262.50 | 66,262.50 |
| 12. | W. R. Hugo Fernando | 316 | Pan Room | 1989 | 11 | 1 | 17 | 1964 | 2 | 25 | 2019 | 2 | 25 | 12 | 10,400.00 | 400.00 | 10,800.00 | 137,700.00 | 32,400.00 | 170,100.00 | 85,050.00 | 85,050.00 |
| 13. | P. A. Siriwardena | 323 | Soap Fini | 1990 | 3 | 1 | 17 | 1969 | 1 | 2 | 2024 | 1 | 2 | 17 | 10,400.00 | 400.00 | 10,800.00 | 137,700.00 | 45,900.00 | 183,600.00 | 91,800.00 | 91,800.00 |
| 14. | K. K. R. Dharmadasa | 324 | Eng | 1990 | 3 | 1 | 17 | 1963 | 9 | 21 | 2018 | 9 | 21 | 11 | 10,000.00 | 500.00 | 10,500.00 | 133,875.00 | 28,875.00 | 162,750.00 | 81,375.00 | 81,375.00 |
| 15. | H. D. Sunil Santha | 325 | Eng | 1990 | 3 | 26 | 17 | 1963 | 12 | 24 | 2018 | 12 | 24 | 11 | 10,000.00 | 500.00 | 10,500.00 | 133,875.00 | 28,875.00 | 162,750.00 | 81,375.00 | 81,375.00 |
| 16. | K. Anthony Fernando | 329 | Garden | 1990 | 4 | 1 | 17 | 1963 | 6 | 6 | 2008 | 6 | 6 | 1 | 8,275.00 | 600.00 | 8,875.00 | 113,156.25 | 2,218.75 | 115,375.00 | 57,687.50 | 57,687.50 |
| 17. | W. A. F. Sisil Fernando | 333 | Soap Fini | 1990 | 7 | 1 | 17 | 1970 | 11 | 13 | 2025 | 11 | 13 | 18 | 10,400.00 | 400.00 | 10,800.00 | 137,700.00 | 48,600.00 | 186,300.00 | 93,150.00 | 93,150.00 |
| 18. | K. Anil Nisantha | 336 | Pan Room | 1990 | 11 | 1 | 16 | 1970 | 7 | 4 | 2025 | 7 | 4 | 18 | 10,400.00 | 400.00 | 10,800.00 | 129,600.00 | 48,600.00 | 178,200.00 | 89,100.00 | 89,100.00 |
| 19. | Sumith Edirisinha | 340 | Eng | 1991 | 9 | 2 | 15 | 1965 | 9 | 21 | 2020 | 9 | 21 | 13 | 9,200.00 | 550.00 | 9,750.00 | 109,687.50 | 31,687.50 | 141,375.50 | 70,687.50 | 70,687.50 |
| 20. | P. A. Gamini Priyantha | 344 | Soap Fini | 1991 | 11 | 1 | 15 | 1969 | 3 | 16 | 2024 | 3 | 16 | 17 | 8,300.00 | 550.00 | 8,850.00 | 99,562.50 | 37,612.50 | 137,175.00 | 68,587.50 | 68,587.50 |
| 21. | T. V. Nihal | 347 | Soap Fini | 1992 | 2 | 1 | 15 | 1959 | 4 | 21 | 2014 | 4 | 21 | 7 | 8,750.00 | 550.00 | 9,300.00 | 104,625.00 | 16,275.00 | 120,900.00 | 60,450.00 | 60,450.00 |
| 22. | K. R. K. Ranasinha | 354 | W. P. | 1992 | 11 | 1 | 14 | 1966 | 9 | 5 | 2021 | 9 | 5 | 14 | 9,200.00 | 400.00 | 9,600.00 | 100,800.50 | 33,600.00 | 134,400.00 | 67,200.00 | 67,200.00 |
| 23. | K. S. Silva | 355 | Pan Room | 1992 | 11 | 1 | 14 | 1972 | 10 | 13 | 2027 | 10 | 13 | 20 | 9,000.00 | 500.00 | 9,500.00 | 99,750.50 | 47,500.00 | 147,250.00 | 73,625.00 | 73,625.00 |
| 24. | A. A. P. Amarasinha | 375 | Soap Fini | 1994 | 7 | 1 | 13 | 1971 | 12 | 14 | 2026 | 12 | 14 | 19 | 9,200.00 | 400.00 | 9,600.00 | 93,600.50 | 45,600.00 | 139,200.00 | 69,600.00 | 69,600.00 |
| 25. | K. S. D. Perera | 377 | Factory | 1994 | 7 | 1 | 13 | 1974 | 8 | 31 | 2029 | 8 | 31 | 22 | 8,300.00 | 550.00 | 8,850.00 | 86,287.50 | 48,675.00 | 134,962.50 | 67,481.25 | 67,481.25 |
| 26. | P. M. R. Bandara | 380 | Soap Fini | 1994 | 7 | 1 | 13 | 1972 | 3 | 4 | 2027 | 3 | 4 | 20 | 9,200.00 | 400.00 | 9,600.00 | 93,600.00 | 48,000.00 | 141,600.00 | 70,800.00 | 70,800.00 |
| 27. | K. D. K. Perera | 381 | Soap Fini | 1994 | 7 | 1 | 13 | 1973 | 3 | 4 | 2028 | 3 | 4 | 21 | 8,300.00 | 550.00 | 8,850.00 | 86,287.50 | 46,462.50 | 132,750.00 | 66,375.00 | 66,375.00 |
| 28. | D. M. G. L. S. L. Kumara | 388 | Lab | 1996 | 5 | 1 | 11 | 1969 | 3 | 2 | 2024 | 3 | 2 | 17 | 7,850.00 | 550.00 | 8,400.00 | 69,300.00 | 35,700.00 | 105,000.00 | 52,500.00 | 52,500.00 |
| 29. | G. R. Weerasooriya | 391 | Pan Room | 1996 | 5 | 1 | 11 | 1973 | 1 | 6 | 2028 | 1 | 6 | 21 | 8,000.00 | 500.00 | 8,500.00 | 70,125.00 | 44,625.00 | 114,750.00 | 57,375.00 | 57,375.00 |
| 30. | W. A. P. Pushpa Kumara | 396 | Gly | 1996 | 11 | 1 | 10 | 1976 | 6 | 25 | 2031 | 6 | 25 | 24 | 7,075.00 | 600.00 | 7,675.00 | 57,562.50 | 46,050.00 | 103,612.50 | 51,806.25 | 51,806.25 |
| 31. | M. R. Pathmasiri Silva | 399 | Soap Fini | 1996 | 11 | 1 | 10 | 1975 | 1 | 24 | 2030 | 1 | 24 | 23 | 7,475.00 | 600.00 | 8,075.00 | 60,562.50 | 46,431.25 | 106,993.75 | 53,496.88 | 53,496.88 |
| 32. | E. M. K. De Seram | 400 | Soap Fini | 1996 | 11 | 1 | 10 | 1975 | 10 | 3 | 2030 | 10 | 3 | 23 | 6,675.00 | 600.00 | 7,275.00 | 54,562.50 | 41,831.25 | 96,393.75 | 48,196.88 | 48,196.88 |
| 33. | L. S. N. Fernando | 402 | Pan Room | 1996 | 11 | 1 | 10 | 1974 | 12 | 27 | 2029 | 12 | 27 | 22 | 7,850.00 | 550.00 | 8,400.00 | 63,000.00 | 46,200.00 | 109,200.00 | 54,600.00 | 54,600.00 |
| 34. | R. P. Jayatissa | 407 | Talc | 1996 | 12 | 4 | 10 | 1967 | 3 | 4 | 2022 | 3 | 4 | 15 | 7,075.00 | 600.00 | 7,675.00 | 57,562.50 | 28,781.25 | 86,343.75 | 43,171.88 | 43,171.88 |
| 35. | K. W. S. Perera | 416 | Talc | 1998 | 8 | 1 | 8 | 1957 | 4 | 19 | 2012 | 4 | 19 | 5 | 6,375.00 | 625.00 | 7,000.00 | 42,000.00 | 8,750.00 | 50,750.00 | 25,375.00 | 25,375.00 |
| 36. | K. L. Prasanna | 418 | Eng | 1998 | 8 | 1 | 8 | 1976 | 8 | 7 | 2031 | 8 | 7 | 24 | 7,850.00 | 550.00 | 8,400.00 | 50,400.00 | 50,400.00 | 100,800.00 | 50,400.00 | 50,400.00 |
| 37. | R. A. S. Rajapaksa | 419 | W. P. | 1998 | 8 | 1 | 8 | 1972 | 5 | 27 | 2027 | 5 | 27 | 20 | 7,075.00 | 600.00 | 7,675.00 | 46,050.00 | 38,375.00 | 84,425.00 | 42,212.50 | 42,212.50 |
| 38. | R. M. T. Pushpa Kumara | 420 | Gly | 1998 | 8 | 1 | 8 | 1977 | 8 | 4 | 2032 | 8 | 4 | 25 | 7,075.00 | 600.00 | 7,675.00 | 46,050.00 | 47,968.75 | 94,018.75 | 47,009.38 | 47,009.38 |
| 39. | W. D. R. P. Fernando | 422 | Pan Room | 1998 | 8 | 1 | 8 | 1977 | 8 | 2 | 2032 | 8 | 2 | 25 | 7,850.00 | 550.00 | 8,400.00 | 50,400.00 | 52,500.00 | 102,900.00 | 51,450.00 | 51,450.00 |
| 40. | W. R. S. Alwis | 426 | Eng | 1998 | 8 | 1 | 8 | 1965 | 10 | 18 | 2020 | 10 | 18 | 13 | 7,525.00 | 600.00 | 8,125.00 | 48,750.00 | 26,406.25 | 75,156.25 | 37,578.13 | 37,578.13 |
| 41. | A. P. Kurundupatabadige | 427 | Eng | 1998 | 8 | 1 | 8 | 1976 | 2 | 15 | 2031 | 2 | 15 | 24 | 8,500.00 | 500.00 | 9,000.00 | 54,000.00 | 54,000.00 | 108,000.00 | 54,000.00 | 54,000.00 |
| 42. | J. A. Wimal Ranaweera Jayakody | 435 | Pan Room | 2000 | 4 | 1 | 7 | 1974 | 4 | 13 | 2029 | 4 | 13 | 22 | 6,675.00 | 600.00 | 7,275.00 | 38,193.75 | 40,012.50 | 78,206.25 | 39,103.13 | 39,103.13 |
| 43. | W. M. Sarath Kumara Wijesundara | 436 | Stores | 2000 | 4 | 1 | 7 | 1978 | 10 | 30 | 2033 | 10 | 30 | 26 | 6,950.00 | 550.00 | 7,500.00 | 39,375.00 | 48,750.00 | 88,125.00 | 44,062.50 | 44,062.50 |
| 44. | R. P. D. Janaka Pushpa Kumara | 437 | Soap Fini | 2000 | 4 | 1 | 7 | 1977 | 10 | 5 | 2032 | 10 | 5 | 25 | 6,675.00 | 600.00 | 7,275.00 | 38,193.75 | 45,468.75 | 83,662.50 | 41,831.25 | 41,831.25 |
| 45. | J. M. N. Pushpa Kumara | 438 | Pan Room | 2000 | 4 | 1 | 7 | 1978 | 6 | 25 | 2033 | 6 | 25 | 26 | 6,675.00 | 600.00 | 7,275.00 | 38,193.75 | 47,285.50 | 85,481.25 | 42,740.63 | 42,740.63 |
| 46. | H. M. Ilankoon Bandara Herath | 440 | Pan Room | 2000 | 4 | 1 | 7 | 1977 | 6 | 21 | 2032 | 6 | 21 | 25 | 6,675.00 | 600.00 | 7,275.00 | 38,193.75 | 45,468.75 | 83,662.50 | 41,831.25 | 41,831.25 |
| 47. | P. R. S. R. Ramanayake | 444 | Soap Fini | 2000 | 8 | 1 | 6 | 1974 | 12 | 24 | 2029 | 12 | 24 | 22 | 6,675.00 | 600.00 | 7,275.00 | 32,737.50 | 40,012.50 | 72,750.00 | 36,375.00 | 36,375.00 |
| 48. | H. M. Bandara | 445 | Eng | 2000 | 8 | 1 | 6 | 1974 | 12 | 24 | 2029 | 12 | 24 | 22 | 6,675.00 | 600.00 | 7,275.00 | 32,737.50 | 40,012.50 | 72,750.00 | 36,375.00 | 36,375.00 |
| 49. | I. A. D. Niranjan | 469 | Eng | 2001 | 9 | 10 | 5 | 1979 | 6 | 21 | 2034 | 6 | 21 | 27 | 6,225.00 | 625.00 | 6,850.00 | 25,687.50 | 46,237.50 | 71,925.00 | 35,962.50 | 35,962.50 |
| 50. | W. D. S. Rupasinha | 361 | Gly | 1993 | 6 | 1 | 14 | 1967 | 12 | 30 | 2022 | 12 | 30 | 15 | 8,750.00 | 550.00 | 9,300.00 | 97,650.50 | 34,875.00 | 132,525.00 | 66,262.50 | 66,262.50 |
| 51. | W. A. Samantha Wijayalath | 411 | Eng | 1998 | 8 | 1 | 8 | 1974 | 7 | 15 | 2029 | 7 | 15 | 22 | 6,950.00 | 1,000.00 | 7,950.00 | 47,700.00 | 43,725.00 | 91,425.00 | 45,712.50 | 45,712.50 |
| 52. | M. P. Sunil Nissanka | 304 | Lab | 1989 | 3 | 1 | 18 | 1961 | 10 | 2 | 2016 | 10 | 2 | 9 | 8,300.00 | 550.00 | 8,850.00 | 119,475.00 | 19,912.50 | 139,837.50 | 69,693.75 | 69,693.75 |

Compensation payable for factory permanent staff (Union Members) as at 21.07.2007

05-442